*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95*
*ISSN 1800-1459*

# සමකාලීන සිංහලයේ යෙදෙන සර්ග

**තරිඳු නුවන් ජයතිස්ස**

භාෂා පරිවර්තක, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

## සාරසංක්ෂේපය

සර්ග යනු, ස්වාධීන පැවැත්මක් නොමැත්තා වූ, 'මූලයක' පූර්වයට මධ්‍යයට හෝ අපර කොටසට උපකාරී ව සම්බන්ධ වන්නා වූ අර්ථවත් භාෂාත්මක ඒකක වේ. සර්ග මූලය හා සම්බන්ධ වන ස්ථානය අනුව පූර්වසර්ග (Prefixes), මධ්‍යසර්ග (Infixes), අපරසර්ග (Suffixes) ලෙස ප්‍රභේද තුනකට ද කාර්යය මත පදනම් ව විභජන සර්ග සහ ව්‍යුත්පන්න සර්ග (Inflectional Affixes and Derivational affixes) යනුවෙන් කොටස් දෙකකට ද බෙදිය හැකි ය. සිංහලයේ වචන වර්ග හතරෙන් නිපාත වචනවල සර්ග නො යෙදෙන අතර, නාම, ක්‍රියා හා විශේෂණ වචනවල සර්ග යෙදේ. ඒවා සමඟ පූර්වසර්ග හා අපරසර්ග යෙදුණ ද සිංහලයේ කිසි විට මධ්‍යසර්ග නොයෙදේ. සිංහලයේ යෙදෙන සියලු පූර්වසර්ග ව්‍යුත්පන්න සර්ග වේ. අපරසර්ග විභජන සර්ග හෝ ව්‍යුත්පන්න සර්ග හෝ විය හැකි ය. සමකාලීන සිංහල නාමවචනයක යෙදෙන සර්ග [(ව්‍යුත්පන්න පූර්වසර්ග)+ නාමමූලය/ප්‍රකෘතිය+ (තද්ධිත ප්‍රත්‍ය)+ ලිංග-වචන ප්‍රත්‍යය+ විභක්ති ප්‍රත්‍යය] යන සූත්‍රයෙන් ද ක්‍රියාවචනයක යෙදෙන සර්ග [(ව්‍යුත්පන්න පූර්වසර්ග)+ ක්‍රියාමූලය/ප්‍රකෘතිය +(ක්‍රියා කෘදන්ත ප්‍රත්‍ය) + ක්‍රියා ප්‍රත්‍යය] යන සූත්‍රයෙන් ද දැක්විය හැකි ය. විශේෂණ ප්‍රකෘති සමග යෙදෙන්නේ ව්‍යුත්පන්න සර්ග පමණකි. විශේෂණ ප්‍රකෘති සමග සම්බන්ධ වන පූර්වසර්ගවල කාර්යය ප්‍රකෘතියේ අර්ථය වෙනස් කිරීම පමණක් වුව ද අපරසර්ග විශේෂණ ප්‍රකෘතියෙන් නාමවචන හෝ ක්‍රියා විශේෂණ නිර්මාණය කරයි.

**කේන්ද්‍රීය වචන** - සර්ග, මූල, ප්‍රකෘති, ව්‍යුත්පන්න සර්ග, විභජන සර්ග, පූර්වසර්ග, මධ්‍යසර්ග, අපරසර්ග තද්ධිත ප්‍රත්‍ය, කෘදන්ත ප්‍රත්‍ය

## හැඳින්වීම

මෙම ලිපියෙහි තේමාව වන්නේ 'සමකාලීන සිංහලයේ යෙදෙන සර්ග' යන්න යි. එමඟින් ඉදිරිපත් කෙරෙන්නේ සමකාලීන සිංහල භාෂණය ප්‍රමාණ කරගනිමින්, එහි කොටසක් වන **සර්ග** (Affixes) නම් පදිම විශේෂය පිළිබඳ ව සංස්ථිතික වාග්විද්‍යාත්මක අධ්‍යයනයකි. එහි දී සිදු කෙරෙන්නේ අර්ථයට වඩා රූපය එනම් සංස්ථිතිය මුල් කොටගනිමින් භාෂාව පිළිබඳ ව සිදු කරන්නා වූ විෂය මූලික (Objective) අධ්‍යයනයකි. එබැවින් සාම්ප්‍රදායික ව්‍යාකරණයේ දී සර්ග පිළිබඳ ව ඉදිරිපත් කෙරෙනවාට වඩා වෙනස් කරුණු ද මෙහි ඉදිරිපත් වන අතර සාම්ප්‍රදායික ව සර්ග වශයෙන් නොසැලකෙන ඇතැම් භාෂාත්මක ඒකක වාග්විද්‍යාත්මක පදනමක් මත පිහිටා මෙහි සර්ග යන ගණයට ඇතුළත් කරන ලදී.

## සාහිත්‍ය විමර්ශනය

සිංහල භාෂණයේ සර්ග පිළිබඳ ව සෘජුව ම සාකච්ඡා කෙරෙන පරිපූර්ණ පර්යේෂණ ග්‍රන්ථයක් මේ වන විට අවිද්‍යමාන ය. එසේ වුවත් ඒ පිළිබඳ යම් යම් කරුණු

ඇතුළත් විවිධ ග්‍රන්ථ සහ ලිපි ලේඛන දැකගත හැකි ය. ඩබ්. එස්. කරුණාතිලක, රත්න විජේතුංග සහ ආර්. එම්. ඩබ්. රාජපක්ෂ විසින් රචිත **වාග් විද්‍යා ප්‍රවේශය (ශබ්ද විචාරය හා පද විචාරය)** යන ග්‍රන්ථය මඟින් පදිම විචාරයේ මූලධර්ම මෙන් ම සිංහලයේ සර්ග පිළිබඳ ව, නිදසුන් ඔස්සේ කරුණු දැක්වෙයි. මෙහි පූර්වසර්ග හා අපරසර්ගවල විස්තෘතිය පිළිබඳ යම් කරුණු දැක්වීමක් සිදු කෙරෙන අතර එහි දී භාවිත වන්නේ පූර්ව ප්‍රත්‍ය හා අපර ප්‍රත්‍ය යන වචන යි.

තිස්ස ජයවර්ධනගේ **ප්‍රථමා විභක්තිය** නම් ලිපිය මඟින් සර්ගවලට අයත් විභක්ති ප්‍රත්‍ය පිළිබඳ දළ විග්‍රහයක් ඉදිරිපත් කෙරෙන අතර සර්ග හඳුනා ගැනීමට අවශ්‍ය මූලධර්ම ද ඉදිරිපත් වේ.

හේමා වීරකෝන්ගේ **ව්‍යවහාර සිංහලයේ ඉලි අන්ත නාම ක්‍රියා පදය** නම් ලිපිය මඟින් නාම ක්‍රියා සාධනයෙහි ලා සර්ග උපයෝගී කෙරෙන ආකාරය පිළිබඳ අවබෝධයක් ලැබේ.

ම. ව. සුගතපාල ද සිල්වාගේ **විග්‍රහාත්මක වාග් විද්‍යාව** හා **භාෂා විෂයක ලිපි** ග්‍රන්ථ මඟින් සර්ග, ඒවායේ සංයුතිය හා විස්තෘතිය මෙන් ම පදිම විචාරයට අයත් මූලික සිද්ධාන්ත පිළිබඳ ව ද කරුණු දැක්වීමක් කෙරී ඇත.

මීට අමතර ව ජේ. බී. දිසානායකගේ **උපසර්ග, ප්‍රත්‍ය, තද්ධිත** යන ග්‍රන්ථ ලේඛන ව්‍යවහාරය ඇසුරින් සම්පාදනය වී තිබුණ ද එමඟින් සර්ග වර්ගීකරණය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය.

සර්ග යන භාෂාත්මක ඒකකය පිළිබඳ න්‍යායාත්මක කරුණු අඩංගු ග්‍රන්ථයක් ලෙස H.A. Gleason විසින් රචනා කරන ලද *An Introduction to Descriptive Linguistics* නම් ග්‍රන්ථය දැක්විය හැකි ය. එහි දී ඉංග්‍රීසි ඇතුළු බොහෝ භාෂාවල භාවිත වන සර්ග කොටස් දෙකක් ලෙස පූර්වසර්ග හා අපරසර්ග හඳුන්වා දී ඇති අතර, සර්ග ඇතුළු පදිම හඳුනා ගැනීමේ දී වැදගත් ම ක්‍රමවේදය වන්නේ සන්සන්දනය බව දක්වා ඇත.

මීට අමතර වශයෙන් පදිම විචාරයේ මූලධර්ම හා සර්ග යන භාෂාත්මක ඒකකය පිළිබඳ මූලික න්‍යායාත්මක කරුණු ඇතුළත් ග්‍රන්ථ වශයෙන් David Crystal විසින් රචනා කරන ලද *The Cambridge Encyclopedia of English Language* නම් ග්‍රන්ථය, Geofry Finch විසින් රචනා කරන ලද *Key Concepts in Language and Linguistics* නම් ග්‍රන්ථය, Andrew Radford ඇතුළු පිරිස විසින් රචනා කරන ලද *Linguistics An Introduction* නම් ග්‍රන්ථය හා Ronald Wardhaugh විසින් රචනා කරන ලද *Introduction to Linguistics* නම් ග්‍රන්ථය දැක්විය හැකි ය.

## පර්යේෂණ ගැටලුව

සමකාලීන සිංහලය් දී කවර වචනවල සර්ග යෙදී තිබේ ද? යන්න මෙම පර්යේෂණයේ මූලික ගැටලුව වේ. මෙම මූලික පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීමේ දී ඊට අදාළ ව තවත් පර්යේෂණ ප්‍රශ්න ගොඩනඟා ගැනිණ.

(i). සිංහල භාෂාවේ පද සිද්ධිය සඳහා සර්ග භාවිත වේ ද?

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95
ISSN 1800-1459

(ii). භාවිත වේ නම් පූර්වසර්ග, මධ්‍යසර්ග හා අපරසර්ග යන කොටස්වලින් කවර කොටස් භාවිතයේ පවතී ද?

(iii). එම සර්ග සංස්ථිතික වශයෙන් හඳුනා ගන්නේ කෙසේ ද?

(iv). සිංහලයේ කුමන වචන නිර්මාණය වීමේ දී සර්ග යෙදේ ද?

(v). ඒ සර්ග විධිමත් සෛද්ධාන්තික රාමුවක් මත වර්ගීකරණයකට ලක් කරන්නේ කෙසේ ද?

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ සිංහල භාෂණයේ පවතින සර්ග යන භාෂාත්මක ඒකකය පිළිබඳ ව පරිපූර්ණ අධ්‍යයනයක් සිදු කිරීම යි. එවැනි පරිපූර්ණ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් මේ වන විට ප්‍රචලිත ව නො පවතී. එබැවින් සිංහලයේ සර්ගවල සංයුතිය හඳුනාගැනීමත් ඒවායේ විස්තෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමත් මින් සිදු විය. එසේ ම හඳුනාගැනෙන සර්ග විධිමත් ලෙස වර්ගීකරණයකට ලක් කර ඉදිරිපත් කිරීම ද අරමුණු විය.

## පර්යේෂණයේ වැදගත්කම

සිංහල භාෂණයේ සර්ග යන භාෂාත්මක ඒකකය පිළිබඳ ව මෙතෙක් කෙරී නොතිබුණු පරිපූර්ණ අධ්‍යයනයක් සිදු කිරීම මෙහි මූලික අරමුණයි. එමගින් එම භාෂාංගය පිළිබඳ ව නව හා විධිමත් දැනුමක් සම්පාදනය කිරීමට අරමුණු කෙරිණි. එයට අමතර ව දෙවන භාෂාවක් ලෙස සිංහල ඉගැන්වීම වැනි ව්‍යවහාරික වාග්විද්‍යාත්මක භාවිතයන් සඳහා ද මේම පර්යේණයේ ප්‍රතිඵල වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම නිබන්ධය සම්පාදනයේ දී සිදු කෙරුණු පර්යේෂණ කාර්යය සඳහා ප්‍රධාන වශයෙන් ම ගුණාත්මක දත්ත රැස් කරන ලද අතර ගැටලුව විශ්ලේෂණය කිරීම සඳහා මූලික වශයෙන් ම ප්‍රාථමික දත්ත භාවිත කරනු ලැබිණ. දත්ත රැස් කිරීමේ දී මූලික විධික්‍රම තුනක් භාවිත කරන ලදී.

I දත්ත පටිගත කිරීම

මෙහි දී වාගාලාප පටිගත කිරීම මඟින් විශ්ලේෂණ කාර්යයෙහි දී යොදාගැනෙන වචන ශ්‍රේණි සකසා ගැනීම සඳහා අවශ්‍ය දත්ත සපයා ගනු ලැබිණ.

II සහභාගී නිරීක්ෂණය

මෙහි දී සංවාදයන්ට ඍජු ව සම්බන්ධ වන අතරතුර දී අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කරගනු ලැබිණ.

III පුස්තකාල සමීක්ෂණය

ද්විතීයික මූලාශ්‍රය සහ න්‍යායික මූලාශ්‍රය ඇසුරින් අවශ්‍ය දත්ත සපයාගැනීම සඳහා මෙම ක්‍රමය භාවිත කරන ලදි.

මෙම දත්ත විශ්ලේෂණයේ දී ඒ සඳහා සංස්ථිතික වාග්විද්‍යාත්මක සිද්ධාන්ත භාවිත කරනු ලැබේ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95
ISSN 1800-1459

## සාකච්ඡාව

### සර්ග යනු

සර්ග යන භාෂාත්මක ඒකකය හඳුනා ගැනෙන්නේ වචනය යන ඒකකය විශ්ලේෂණය කිරීමෙනි. වචනයක් නිර්මාණය වන්නේ පදිම නම් භාෂාත්මක ඒකකවල එකතුවෙනි. "ඇතැම් පදිම, භාෂා සංස්ථිතියේ පවතින අවම අර්ථවත් ඒකක ලෙස ප්‍රයෝජනවත් ව විස්තර කළ හැකි ය." යනුවෙන් ග්ලීසන් පදිමය නිර්වචනය කරයි (1969:53).

ලෝකයේ පවතින භාෂාවල දැකිය හැකි, බොහෝ දුරට ම විශ්ව සාධාරණ වූ පදිම වර්ග දෙකක් හඳුනාගත හැකි ය. යම් වචනයකට අයත් වචන ශ්‍රේණියක් පරීක්ෂා කිරීමෙන් මෙම පදිම වර්ග දෙක හඳුනාගත හැකි ය. වාග්විද්‍යාවේ දී පදිම හඳුනාගත හැකි එක ම ක්‍රමය වන්නේ භාෂාත්මක කොටස් සන්සන්දනය කිරීම යි.

යම් වචන ශ්‍රේණියක් සැලකූ විට එහි ඇති සියලු රූපවල, පොදු පදිමයක් හා එයට සම්බන්ධ වන අසමාන පදිම පවතින බව දැකගත හැකි ය. නිදසුන් ලෙස /manussəya/, /manussəyage/, /manussəyaʈə/ ආදී වචන ශ්‍රේණියේ සියලු රූපවල /manussə/ යන පොදු පදිමයක් ද එයට සම්බන්ධ වන /-a/, /a-/, /-ek/, /-ʈə/, /-gen/, /-o/ ආදී අසමාන පදිම ද පවතී.

එ සේ ම ඉංග්‍රීසි භාෂාවේ 'work', 'works', 'worked', 'worker', 'workers', 'working' ආදී වචනවල 'work' යන පොදු පදිමයත් '-s', '-ed', '-ing' '-er', '-s', ආදී අසමාන පදිමත් අඩංගු වේ. ඒ අනුව මෙම පදිම වර්ග දෙක

1. මූල (Roots)
2. සර්ග (Affixes) වශයෙන් හඳුනාගත හැකි ය.

මූලයක් යනු වචනයක ඇති වඩාත් මූලික පදිමය වශයෙන් ඇන්ඩෘ රැඩ්ෆඩ් ඇතුළු පිරිස (1999:163) නිර්වචනය කොට ඇත. ''වචනයක් ව්‍යුත්පන්න වීමේ දී වැදගත් ආරම්භක ලක්ෂ්‍යය වන්නේ, එහි මූලය යි'' (Radford 1999:163).

සර්ග යන පදිම විශේෂය නිරන්තරයෙන් ම බද්ධ පදිම (bound morphemes) වන බව අපට හඳුනාගත හැකි ය. එ නම් ඒවා තනි ව පවතින වචන ලෙස ක්‍රියාත්මක නොවන අතර සැම විට ම වෙනත් පදිමයක් හා බැඳී පවතී. මේ අනුව ග්ලීසන් (1969:59) තම නිර්වචනයේ දී දක්වන්නේ ''සාමාන්‍යයෙන් වචන වැනි නිර්මාණයක දී මූල කේන්ද්‍රීය වන අතර 'සර්ග' මූලවලට උපකාරී ව සිටී." යනුවෙනි .

ඩේවිඩ් ක්‍රිස්ටල්ගේ නිර්වචනයට අනුව (1995:198) සර්ග යනු, මූල රූපය හා බැඳෙන අර්ථයක් සහිත වූ පරායත්ත අංගයකි. ඒ බව ඔහු "ඉංග්‍රීසියේ, මූලයට ඉදිරියෙන් මෙන් ම පසුපසින් ද අර්ථයක් සහිත පරායත්ත අංගයන් එක් වීමේ අවස්ථාව පවතී. එම අංග සර්ග නම් වේ." (Crystal 1995:198) යි දක්වා ඇත .

ඇන්ඩෘ රැඩ්ෆඩ් ඇතුළු පිරිස සිය නිර්වචනයෙහි දී, අවධානය යොමු කරන්නේ සර්ග, මූලයට එක් වන දිශාව පිළිබඳ ව යි. මූලයට දකුණු පසින් එක් වන සර්ග අපරසර්ග (Suffixes) වන අතර වම් පසින් එක් වන සර්ග පූර්වසර්ග (Prefixes) වේ. පූර්වසර්ග හා අපරසර්ග සඳහා යෙදෙන සාමාන්‍ය යෙදුම වන්නේ සර්ග යන්න යි.

> ''මූලයක දකුණු පසට එක් කරන -er/-or වැනි පදිම අපරසර්ග වේ. මූලයේ වම් පසට එක් කරනු ලබන re- වැනි ඒවා පූර්වසර්ග වේ. අපරසර්ග හා පූර්වසර්ග ආවරණය කරන සාමාන්‍ය යෙදුම සර්ග නම් වේ'' (Radford 1999:163).

මේ අනුව සර්ගවල මූලික ලක්ෂණ කිපයක් හඳුනාගත හැකි ය.

- සර්ගයෙහි අර්ථයක් ගැබ් ව පවතී.
- එය 'මූලයට' උපකාරී ව සිටී.
- එයට ස්වාධීන පැවැත්මක් නොමැත.
- එය 'මූලයේ' පූර්වයට, මධ්‍යයට හෝ අපර කොටසට සම්බන්ධ කළ හැකි ය.

ඒ අනුව, ස්වාධීන පැවැත්මක් නොමැත්තා වූ, 'මූලයේ' පූර්වයට මධ්‍යයට හෝ අපර කොටසට උපකාරී ව සම්බන්ධ වන්නා වූ අර්ථවත් භාෂාත්මක ඒකක සර්ග නම් වේ.

## සර්ග ප්‍රභේද

සර්ග මූලය හා සම්බන්ධ වන ස්ථානය අනුව ප්‍රභේද තුනකට බෙදා දැක්වේ.

1. පූර්වසර්ග (Prefixes)
2. මධ්‍යසර්ග (Infixes)
3. අපරසර්ග (Suffixes)

මූලයකට පූර්වයෙන් ඒ හා සම්බන්ධ වන්නා වූ සර්ග පූර්වසර්ග නම් වේ. සිංහල භාෂාවෙහි *අකුසල්* යන වචනයේ ඇති /a-/ *අනවසර* යන වචනයේ ඇති /an-/ *පිළිගන්නවා* යන වචනයේ ඇති /pili-/ *අවලස්සන* යන වචනයේ ඇති /avə-/ ආදී සර්ග පූර්වසර්ග වේ.

යම් මූලයක් අතරට යෙදී සම්බන්ධ වන්නා වූ සර්ග මධ්‍යසර්ග නම් වේ. 'ටැගලොග්' (Tagalog) භාෂාවෙහි *'gulay'* යන ප්‍රකෘතියෙන් *'ginulay,* යන වචනය නිර්මාණය වීමේ දී මූලය අතරට යෙදී ඇති *–in-* යන සර්ගය මධ්‍යසර්ගයක් වශයෙන් ග්ලීසන් (1969:73) දක්වා ඇත. ඉංග්‍රීසි භාෂාවේ මෙන් ම සිංහල භාෂාවේ මධ්‍යසර්ග යෙදී නැත.

මූලයකට පසුපසින් ඒ හා සම්බන්ධ වන්නා වූ සර්ග අපරසර්ග නම් වේ. සිංහල භාෂාවේ /balla/ යන වචනයේ ඇති /-a/, /balənəva/ යන වචනයේ ඇති /-nəva/ මෙන් ම /viʃa:lətəmə/ යන වචනයේ ඇති /-təmə/ යන සර්ග අපරසර්ග වේ.

සර්ගවල කාර්යය මත පදනම් ව විභජන සර්ග සහ ව්‍යුත්පන්න සර්ග (Inflectional Affixes and Derivational Affixes) යනුවෙන් කොටස් දෙකක් හඳුනාගැනේ. මෙහි දී වචනය පිළිබඳ වැදගත් සංකල්ප දෙකක් *Linguistics an Introduction* (Radford 1999:165-166) නම් ග්‍රන්ථයේ සඳහන් ව ඇත. එනම්,

1. වචනය (Lexeme)
2. වචන රූප (Word form)

වචනය යන ඒකකය නිරන්තරයෙන් ම වෙනස් වූ ප්‍රකෘති (Stems) මඟින් නිර්මාණය වේ.

නිදා:- /va:səna:-ə/ (*වාසනාව*)

/ba:vəna:-ə/ (*භාවනාව*)

ISSN 1800-1459

ඉහත ඒකක /va:sǝna:/ සහ /ba:vǝna:/ යන ප්‍රකෘති දෙකකින් නිර්මාණය වී ඇති නිසා ඒවා වචන යනුවෙන් හැඳින්වේ. /va:sǝna:/ යන ප්‍රකෘතියෙන් /va;sǝna:vantǝ/ යන නව ප්‍රකෘතියක් නිර්මාණය කරගත හැකි ය. එවිට එය මුල් ප්‍රකෘතියට වඩා වෙනස් වූ ප්‍රකෘතියක් වන බැවින්, එයින් නිර්මාණය වන භාෂාත්මක ඒකක ද වචන ගණයෙහි ලා සැලකේ.

/va:sǝna:-ǝ/ (*වාසනාව*)

/va:sǝna:-vantǝ-ek/ (*වාසනාවන්තයෙක්*)

එසේ වුව ද *'වාසනාව', 'වාසනාවක්'* යන රූප එක ම ප්‍රකෘතියක් ඇසුරින් නිර්මාණය වී ඇති බැවින් ඒවා එක් වචනයකට අයත් වචන රූප යනුවෙන් හැඳින්වේ. /va:sǝna:/ යනු මෙහි එක ම ප්‍රකෘතිය යි. මේ අනුව පදිම විචාරයේ ක්ෂේත්‍ර දෙකක් හඳුනාගත හැකි ය.

1. විභජන පදිම විචාරය (Inflectional Morphology)
2. ව්‍යුත්පන්න පදිම විචාරය (Derivational Morphology)

එක් වචනයක 'වචන රූප' නිර්මාණය වීම පිළිබඳ ක්ෂේත්‍රය විභජන පදිම විචාරයට අයත් වන අතර වෙනස් වූ 'වචන' නිර්මාණය පිළිබඳ ක්ෂේත්‍රය ව්‍යුත්පන්න පදිම විචාරයට අයත් වේ. මෙහි දී කාර්ය භාරය අනුව සර්ගවල වර්ග දෙකක් හඳුනාගත හැකි ය.

1. විභජන සර්ග (Inflectional Affixes)
2. ව්‍යුත්පන්න සර්ග (Derivational Affixes)

විභජන සර්ගයක් යනු යම් වචනයක වචන රූප නිර්මාණය වීමේ දී සම්බන්ධ වන සර්ග වශයෙන් හඳුනාගත හැකි ය. මෙම සර්ගවල 'බහු වචන', 'සම්බන්ධ', 'අතීත කාලය' ආදි අර්ථ පවතින අතර එම සර්ග කුඩා කුලක වශයෙන් දක්නට ලැබේ. එම කුඩා ප්‍රමාණයක් වන සර්ග විශාල ප්‍රකෘති ප්‍රමාණයක් සමඟ සම්බන්ධ වීම එහි ලක්ෂණයකි.

> ''විභජන සර්ග යනු 'බහු වචන', 'සම්බන්ධාර්ථය', අතීත කාලය' හෝ 'ස්ත්‍රීලිංග' වැනි අර්ථ සහිත පදිම වන අතර ඒවා කුඩා කුලක (Small sets) වශයෙන් දක්නට ලැබෙතත් විශාල ප්‍රකෘති ප්‍රමාණයක් සමඟ සම්බන්ධ වේ''(Wardhauge1972:77).

ක්‍රිස්ටල්ට අනුව (1995:198) මෙම සර්ග සපුරා ම ව්‍යාකරණමය වන අතර ඒවායේ භූමිකාව වන්නේ වචනය වාක්‍යයන්හි භාවිත කළ යුත්තේ කෙසේ ද? යන්න දැක්වීම යි .

*අත දෙන්න*

*අතට දෙන්න*

මෙම වාක්‍ය දෙක වෙනස් වාක්‍ය දෙකක් වන අතර එයට පදනම් වී ඇත්තේ /-ǝ -ɸ/ සහ /-ǝ -ṭǝ/ යන විභජන සර්ගයි.

විභජන සර්ග කුඩා සංඛ්‍යාවක් පවතින බව ජෙෆ්රි ෆින්ච් (2005:99-100) දක්වන අතර ඒවායෙහි වර්ග කීපයක් ද දක්වා ඇත.

ක්‍රියා විභජන (Verb Inflections)

නාම විභජන (Noun Inflections)

විශේෂණ විභජන (Adjective/Adverb Inflections)

ව්‍යුත්පන්න සර්ග යනු නව 'වචනයක්' නිර්මාණය වීමේ දී යෙදෙන සර්ග යි. මේවා ඉංග්‍රීසියේ මෙන් ම සිංහලයේ ද ප්‍රමාණයෙන් වැඩි ය. ක්‍රිස්ටල් පවසන්නේ "මේවායෙහි මූලික කාර්යය වන්නේ මූල රූපයෙහි අර්ථය වෙනස් කිරීම යි." යනුවෙනි (1995:198).

නිදසුනක් ලෙස *වාසනාව* යන වචනයෙහි ඇති /va;səna:/ යන ප්‍රකෘතියෙහි අර්ථය *වාසනාවන්තයා* යන වචනයෙහි ප්‍රකෘතිය වන /va;səna:-vantə/ යන්නෙහි දී වෙනස් වී ඇත. මූල රූපයෙහි එම අර්ථය වෙනස් කරන ලද්දේ /-vantə/ යන ව්‍යුත්පන්න ප්‍රත්‍යය මඟිනි.

පදිම විචාරයේ දී විශ්ලේෂණයට ලක් කළ හැකි වචන වර්ග හතරක් සිංහල භාෂාවේ හඳුනාගත හැකි ය.

| I වර්ගය | II වර්ගය | III වර්ගය | IV වර්ගය |
|---|---|---|---|
| බල්ලා | බලනවා | කීකරු | ඇයි? |
| බල්ලාට | බලන්න | අකීකරු | |
| බල්ලාගෙ | බලපං | කීකරුව | |
| බල්ලාගෙන් | බලද්දි | | |
| බල්ලෙක් | බලතොත් | | |
| බල්ලො | බලවනවා | | |
| බල්ලන්ට | බැලෙනවා | | |
| බල්ලන්ගෙ | බැලුවා | | |
| .......... | ........... | | |

මෙම වචන වර්ග හතර

I නාම වචන

II ක්‍රියා වචන

III විශේෂණ වචන

IV නිපාත වචන ලෙස හැඳින්විය හැකි ය.

මේ අතරින් නිපාත වචන යනු වචන ශ්‍රේණියක් නොමැති වචන වන බැවින් ඒවා සමඟ සර්ග යෙදීමක් සිදු නොවේ. අනෙකුත් වචන වර්ගවල එකිනෙකට වෙනස් වචන-රූප පවතින බැවින් ඒවායෙහි සර්ග යෙදී ඇති ආකාරය හඳුනාගත හැකි ය. මූලික වශයෙන් මෙම වර්ග තුනට අයත් වචන ශ්‍රේණි පරීක්ෂා කිරීමෙන්, යෙදෙන ස්ථානය අනුව, සිංහලයේ භාවිත වන සර්ග මොනවා ද? යන්න හඳුනාගත හැකි ය.

*ISSN 1800-1459*

| | | | |
|---|---|---|---|
| | මනුස්ස | ආ | /manussə-a/ |
| | මනුස්ස | ආ-ට | /manussə-a-ʈə / |
| | මනුස්ස | ආ-ගෙ | /manussə-a-ge/ |
| | මනුස්ස | ආ-ගෙන්/ | manussə-a-gen/ |
| | මනුස්ස | එක් | /manussə-ek/ |
| අ- | මනුස්ස | ආ | /a-manussə-a/ |
| අ- | මනුස්ස | එක් | /a-manussə-ek/ |

| | | | |
|---|---|---|---|
| | හිත | නවා | /hitə-nəva/ |
| | හිත | න්න | /hitə-nnə/ |
| | හිත | තොත් | /hitə-tot/ |
| | හිත |ද්දි | /hitə-ddi/ |
| | හිත | න | /hitə-nə/ |
| | හිත | පු | /hitə-pu/ |
| | හිතු | ආ | /hitu-a/ |
| නො- | හිත | පු | /no-hitə-pu/ |
| නො- | හිත | න | /no-hitə-nə/ |

| | | | |
|---|---|---|---|
| | අහංකාර | | /ahaŋka:rə/ |
| නිර්- | අහංකාර | | /nir-ahaŋka:rə/ |
| | අහංකාර | කම් | /ahaŋka:rə-kəm/ |
| නිර්- | අහංකාර | කම් | /nir-ahaŋka:rə-kəm/ |

මෙම වචන ගොනු තුන අනුව පැහැදිලි වන්නේ සිංහලයේ නාම, ක්‍රියා හා විශේෂණ ප්‍රකෘති සමඟ පූර්වසර්ග හා අපරසර්ග යන සර්ග කොටස් දෙක යෙදී ඇතත්, කිසි විටෙක මධ්‍යසර්ග යෙදී නොමැති බව යි. මෙම වචන ගොනු තුනෙහි මෙන් ම වෙනත් පූර්ණ වචන ගොනු පරීක්ෂා කිරීමෙන් ද පැහැදිලි වන්නේ සිංහල භාෂාවේ කිසි ම අවස්ථාවක මධ්‍යසර්ග (Infixes) නොයෙදෙන බව යි. ඒ අනුව සර්ග යෙදෙන ස්ථානය අනුව, සිංහල වචනයක ආකෘතිය සරල ව මෙසේ දැක්විය හැකි ය.

| පූර්වසර්ග + ප්‍රකෘතිය + අපරසර්ග |
|---|

සිංහල භාෂාවේ යෙදෙන පූර්වසර්ග සාම්ප්‍රදායික භාෂා විග්‍රහයේ දී උපසර්ග යන නමින් හැඳින්වෙන අතර අපරසර්ග සඳහා ප්‍රත්‍ය යන නාමය යෙදේ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95
ISSN 1800-1459

## සිංහලයේ නාම ප්‍රකෘති සමඟ යෙදෙන සර්ග

සිංහලයේ නාම ප්‍රකෘති සමඟ පූර්වයත් සඳහන් කළ පරිදි පූර්වසර්ග හා අපරසර්ග යෙදිය හැකි ය. කාර්යමය වශයෙන් නාම ප්‍රකෘති සමඟ යෙදෙන සියලු පූර්වසර්ග ව්‍යුත්පන්න සර්ග වේ. එ නම් ඒවායේ කාර්යය වන්නේ නව ප්‍රකෘතියක් නිපදවීම යි.

නිදः a:ca:rə *(ආචාර)* an-a:ca:rə *(අනාචාර)*

kusal *(කුසල්)* a-kusal *(අකුසල්)*

නාම ප්‍රකෘති සමඟ සිංහල භාෂාවේ යෙදෙන අපරසර්ග විභජන සර්ග හෝ ව්‍යුත්පන්න සර්ග හෝ විය හැකි ය. නිදසුනක් ලෙස *සිල්වතෙක්* /silvətek/ යන වචනයෙහි අපරසර්ග දෙකක් යෙදී ඇති අයුරු හඳුනාගත හැකි ය.

sil-vat-ek

නාම ප්‍රකෘතිය {-vat}{-ek}

මෙහි ප්‍රථමයෙන් යෙදී ඇති {-vat} යන පදිමය 'ඇත්තේ ය' යන අර්ථය සහිත ව නව නාම ප්‍රකෘතියක් නිර්මාණය කරන්නා වූ ව්‍යුත්පන්න සර්ගයකි. දෙවනු ව යෙදී ඇති {-ek} යනු අනියත ඒක වචන විභජන ප්‍රත්‍යය යි. මෙසේ සර්ග එකකට වැඩි සංඛ්‍යාවක් යෙදෙන විට එම සර්ග යෙදෙන පිළිවෙළ සම්බන්ධ ව යම් මූලධර්ම, රීති පවතී. නිදසුන් ලෙස ඉංග්‍රීසි භාෂාවේ *judgmental* යන වචනයේ ඇති *–ment, -al* යන සර්ගත් *antirearm* යන වචනයේ ඇති *anti-, re-* යන සර්ගත් අනුපිළිවෙළ වෙනස් වී නොයෙදේ. එ බැවින් "**judgalment* සහ **reantiarm* භාෂාවේ නොපවතින බැවින් පිළිවෙළ සම්බන්ධ යම් මූලධර්ම පැහැදිලිව පවතී" යි චෝම්ස්කි පෙන්වා දෙයි (1972:77).

සිංහල භාෂාවේ සැම විට ම ව්‍යුත්පන්න සර්ගය ප්‍රථමයෙන් ද ඉන් පසු ව විභජන සර්ගය ද යෙදේ. එ හෙයින් *සිල්-වත්-එක්, ඇමති-වර-උ* ආදි ලෙස වචන නිර්මාණය වුව ද **සිල්-එක්-වත්* හෝ **ඇමති-උ-වර* වශයෙන් වචන නිර්මාණය සිදු නොවේ. ඒ අනුව සිංහලයේ නාම ප්‍රකෘතියක් සමඟ යෙදෙන මූලික සර්ග මෙසේ දැක්විය හැකි ය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යුත්පන්න පූර්වසර්ග | + | නාම ප්‍රකෘතිය | + | ව්‍යුත්පන්න අපරසර්ග | + | විභජන සර්ග |

නිදः- a-va:səna:-vantə-ek *(අවාසනාවන්තයෙක්)*

a-manussə-ɸ-o *(අමනුස්සයො)*

නාම වචනයක් තුළ ව්‍යුත්පන්න සර්ග එකකට වැඩි සංඛ්‍යාවක් යෙදීමට ඉඩකඩ පවතී. නිදසුන් ලෙස *නීතිඥවරයා* යන වචනයෙහි /-ɲɲə/, /-vərə/ යන සර්ග දෙක ම ව්‍යුත්පන්න සර්ග වේ. *නීතිඥවරියක්* යන වචනයෙහි /-ɲɲə/, /-vərə/ සහ /-i/ යනුවෙන් ව්‍යුත්පන්න සර්ග තුනක් යෙදී ඇත. මෙ සේ නාම ප්‍රකෘති සමඟ යෙදෙන ව්‍යුත්පන්න සර්ග තද්ධිත ප්‍රත්‍යය යන නමින් හැඳින්වේ.

නාම ප්‍රකෘති සමඟ යෙදෙන ඇතැම් තද්ධිත ප්‍රත්‍යය නව නාම ප්‍රකෘති මෙන් ම විශේෂණ ප්‍රකෘති ද නිර්මාණය කරයි. ඒ අනුව ඒවා විභජන සර්ගයක් සහිත ව

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95
ISSN 1800-1459

නාම වචනයක් ලෙස හෝ විභජන සර්ගයක් රහිත ව විශේෂණ වචනයක් ලෙස හෝ ක්‍රියාත්මක විය හැකි ය. ඒ බව "නාම ප්‍රකෘතියකට අනතුරු ව ව්‍යුත්පන්න (-තද්ධිත/කෘදන්ත) ප්‍රත්‍යයක් යෙදී පහළ වූ පද ද විශේෂණ වශයෙන් ක්‍රියා කරයි." යි ජයවර්ධන (1996:17)දක්වයි.

නිදා: නාම වචනය - va:sənaː-vantə-ek *(වාසනාවන්තයෙක්)*

විශේෂණ වචනය - va:sənaː-vantə *(වාසනාවන්ත මිනිහා)*


විභජන සර්ග ඉංග්‍රීසි භාෂාවේ මෙන් ම සිංහල භාෂාවේ ද වචනයක අවසානයට යෙදෙන සර්ග වේ. වාග්වේදීන්ට අනුව ඉංග්‍රීසි භාෂාවේ නිතර ම එක් වචනයක යෙදෙන්නේ එක් විභජන සර්ගයකි. ඒ අනුව ඉංග්‍රීසි ප්‍රකෘතියකට එක් විභජන සර්ගයක් සම්බන්ධ වූ පසු එයට පූර්වසර්ගයක් හෝ අපරසර්ගයක් එක් වීම සිදු නොවේ. ඒ බව ග්ලීසන් (1969:96) පවසන්නේ "ඉංග්‍රීසි විභජන සර්ග නියත වශයෙන් ප්‍රකෘති නිර්මාණය නොකරයි. එනම් සාමාන්‍යයෙන් වචනයකට එවන් සර්ගයක් එක් වූ විට, වෙනත් අපරසර්ගයක් හෝ පූර්වසර්ගයක් එක් නොවේ." යනුවෙනි.

සිංහල භාෂාවෙහි ද විභජන සර්ගයකට පසු ව වෙනත් වර්ගයකට අයත් සර්ගයක් ඒ සමඟ එක් නොවෙතත් නාම ප්‍රකෘතියක් සමඟ විභජන සර්ග දෙකක් සංයෝග විය හැකි ය.

> ව්‍යවහාර සිංහලයෙහි නාම වචනය පද තුනකින් සමන්විතය. ප්‍රකෘතිය + පළමුවන ප්‍රත්‍යය + දෙවන ප්‍රත්‍යය යනුවෙනි. පළමුවන ප්‍රත්‍යය ලිංග-වචන ප්‍රත්‍යයයි. ... දෙවන ප්‍රත්‍යය විභක්ති ප්‍රත්‍යයයි (ද සිල්වා 1963:81).

| ප්‍රකෘතිය | ප්‍රත්‍යය 1 | ප්‍රත්‍යය 2 |
|---|---|---|
| මිනිහ් | - අ | - # |
| මිනිහ් | - අ | - ගෙ |
| මිනිස්ස් | - උන් | - ට |

මෙම ප්‍රත්‍යය විභජන සර්ග වන අතර පළමු වන ප්‍රත්‍යය ලිංග-වචන ප්‍රත්‍යය ලෙස ද දෙවන ප්‍රත්‍යය විභක්ති ප්‍රත්‍යය ලෙස ද හැඳින්වේ. ඒ අනුව නාම ප්‍රකෘතියක් සමඟ යෙදෙන සර්ග මෙසේ දැක්විය හැකි ය.



| වුයුත්.පූ.ස. + නා.මූ./ප්‍රකෘ. + ත.ප්‍ර. + ලි.ව.ප්‍ර. + වි.ප්‍ර. |
|---|

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නිදඃ | අධි- | නීති | -ඥ | -ආං | -ට | *(අධිනීතිඥයාට)* |
| | උප- | ගුරු | -වර | -ආ | -ගේ | *(උපගුරුවරයාගේ)* |
| | අ- | මනුස්ස | -ϕ | -එක් | -ϕ | *(අමනුස්සයෙක්)* |
| | ϕ- | සිල් | -වත් | -උ | -ϕ | *(සිල්වත්තු)* |
| | ϕ- | ගම් | -ඉ | -අන් | -ගෙන් | *(ගැමියන්ගෙන්)* |
| | ϕ- | පුටු | -ϕ | -ϕ | -එන් | *(පුටුවෙන්)* |

ක්‍රියා මූලයකට ව්‍යුත්පන්න සර්ගයක් එක් වීමෙන් නාම ප්‍රකෘතියක් නිර්මාණය විය හැකි ය. එවිට එය ක්‍රියා මූලයකින් නිර්මාණය වන්නේ වුව ද නාම ප්‍රකෘතියක් වන බැවින් ඉහත දැක්වූ රටාව අනුව භාෂාව තුළ ව්‍යක්ත වේ.

ϕ-[නට-න්න්]-ඉ-අක-ට *(නටන්නියකට)*

ϕ-[ලිය-න්න්]-ϕ-ආ-ϕ *(ලියන්නා)*

## සිංහලයේ ක්‍රියා ප්‍රකෘති සමඟ යෙදෙන සර්ග

සිංහල භාෂාවෙහි ක්‍රියා ප්‍රකෘති සමඟ ද පූර්වසර්ග මෙන් ම අපරසර්ග යෙදී ඇත. එසේ යෙදෙන පූර්වසර්ග සියල්ල ද කාර්යමය වශයෙන් ව්‍යුත්පන්න සර්ග වේ.

| | | | |
|---|---|---|---|
| gannəva | *(ගන්නවා)* | pili-gannava | *(පිළිගන්නවා)* |
| kərəpu | *(කරපු)* | no-kərəpu | *(නොකරපු)* |

සිංහල ක්‍රියා ප්‍රකෘති සමඟ ද ව්‍යුත්පන්න සර්ග හා විභජන සර්ග අපරසර්ග වශයෙන් යෙදේ. නිදසුන් ලෙස *කරවනවා* /kərəvənəva/ යන වචනයෙහි ව්‍යුත්පන්න සර්ගයක් සහ විභජන සර්ගයක් යෙදී ඇත.

kərə-və-nəva

ක්‍රියා ප්‍රකෘතිය{-və}{-nəva}

මෙහි ප්‍රථමයෙන් යෙදී ඇති {-və} සර්ගය ප්‍රයෝජ්‍ය අර්ථය සහිත ව්‍යුත්පන්න සර්ගයකි. එ මඟින් *කරව* /kərəvə/ යන නව ප්‍රකෘතිය නිර්මාණය කරයි. දෙවනු ව යෙදී ඇති {-nəva} යන සර්ගය වර්තමාන කාලය හඟවන විභජන සර්ගයකි. ඒ අනුව සිංහල ක්‍රියා ප්‍රකෘතියක් සමඟ යෙදෙන මූලික සර්ග මෙසේ ය.

සබරගමුව විශ්වවිද්‍යාලීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95
ISSN 1800-1459

| වුයුත්පන්න පූර්වසර්ග | + | ක්‍රියා ප්‍රකෘතිය | + | වුයුත්පන්න අපරසර්ග | + | විභජන සර්ග |
|---|---|---|---|---|---|---|

නිදː pili-gan-və-nəva *(පිළිගන්වනවා)*

kaḍə-və-nəva *(කඩවනවා)*

balə-və-nəva *(බලවනවා)*

ක්‍රියා ප්‍රකෘති සමඟ යෙදෙන වුයුත්පන්න සර්ග කෘදන්ත ප්‍රත්‍ය නම් වේ. කෘදන්ත ප්‍රත්‍ය මඟින් ඉටු වන කාර්යයන් දෙකක් හඳුනාගත හැකි ය.

I නාම ප්‍රකෘති සාධනය
II නව ක්‍රියා ප්‍රකෘති සාධනය

මෙම කාර්යයන් සඳහා යෙදෙන කෘදන්ත ප්‍රත්‍යය එකිනෙකින් වෙන් කොට හඳුනාගත යුතු ය. ඒ අනුව ඒවා

I නාම කෘදන්ත ප්‍රත්‍යය
II ක්‍රියා කෘදන්ත ප්‍රත්‍යය ලෙස නම් කළ හැකි ය.

නාම කෘදන්ත ප්‍රත්‍යය මඟින් මෙන් ම තද්ධිත ප්‍රත්‍ය මඟින් ද නිර්මාණය වන්නේ නාම ප්‍රකෘති යි. එම ප්‍රත්‍යය දෙවර්ගයෙහි වෙනස වන්නේ තද්ධිත ප්‍රත්‍යය නාම ප්‍රකෘතියකින් නව නාම ප්‍රකෘතියක් නිර්මාණය කරන අතර නාම කෘදන්ත ප්‍රත්‍ය ක්‍රියා ප්‍රකෘතියකින් නාම ප්‍රකෘතියක් නිර්මාණය කිරීම යි. ඒ අනුව තද්ධිත ප්‍රත්‍යයක් කිසි විටෙකත් ක්‍රියා ප්‍රකෘතියක් සමඟ නොයෙදෙන අතර නාම කෘදන්ත ප්‍රත්‍යයක් කිසි විට නාම ප්‍රකෘතියක් සමඟ නොයෙදේ.

*සිල්-වත්-එක්* *(සිල්වතෙක්)*
*නට-ඊම්-අක්* *(නැටීමක්)*

**සිල්-ඊම්-අක්*
**නට-වත්-එක්*

නාම කෘදන්ත ප්‍රත්‍යයක් එක් වූ පසු ක්‍රියා ප්‍රකෘතිය නාම ප්‍රකෘතියක් බවට පත් වන බැවින් ඉන් පසු එයට බලපාන්නේ නාම වචන සාධනය පිළිබඳ ව හඳුනාගැනෙන සූත්‍ර යි.

naṭə-nn-eku-ṭə *(නටන්නෙකුට)*

ක්‍රියා කෘදන්ත ප්‍රත්‍ය යෙදීමෙන් නිර්මාණය වන ඇතැම් කෘදන්ත රූප විශේෂණ වචන වශයෙන් ද යෙදෙන බව "ක්‍රියා ප්‍රකෘතියකට අනතුරුව වුයුත්පන්න ප්‍රත්‍ය යෙදී විශේෂණ පහළ වෙයි." යනුවෙන් (ජයවර්ධන 1996:18) දක්වා ඇත.

එ බැවින් ඒවා පරිසරය අනුව ක්‍රියා වචන ලෙස හෝ විශේෂණ වචන ලෙස යෙදිය හැකි ය.

නිදː ක්‍රි.ව. *ඔයා බලන කොට එයා හැංගෙනවා.*
*ඔයා බලපු විදියට ළමයා බය උණා.*


වි.ව. *බලන පොත*
*බලපු පොත*

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95
ISSN 1800-1459

ක්‍රියා කෘදන්ත ප්‍රත්‍ය නව ක්‍රියා ප්‍රකෘති නිර්මාණය කරන බැවින් ඒවාට ක්‍රියා ප්‍රකෘති සමඟ යෙදෙන විභජන සර්ග සම්බන්ධ වේ. එසේ වුව ද ක්‍රියා කෘදන්ත ප්‍රත්‍යයකට පසු ව නාම කෘදන්ත ප්‍රත්‍යයක් එක් වුවහොත් ඒ සමඟ ක්‍රියා ප්‍රත්‍ය සම්බන්ධ නොවේ.

naʈə-və-nn-ek [*(නයි) නටවන්නෙක්*]

ක්‍රියා ප්‍රකෘති සමඟ විභජන සර්ග ලෙස යෙදෙන්නේ ක්‍රියා ප්‍රත්‍ය යි. ඒ අනුව ක්‍රියා ප්‍රකෘතියක් සමඟ යෙදෙන සර්ග මෙසේ දැක්විය හැකි ය.




ව්‍යු.පූ.ස + ක්‍රි.මූ./ප්‍රකෘ. + ක්‍රි.කෘ.ප්‍ර + ක්‍රි.ප්‍ර.

| | | | | | |
|---|---|---|---|---|---|
| නිද: | පිලි- | ගන් | -ව | -නවා | *(පිළිගන්වනවා)* |
| | ϕ- | අඬ | -ව | -නවා | *(අඬවනවා/අඬෝනවා)* |
| | නො- | කර | -ϕ | -ද්දි | *(නොකරද්දි)* |
| | ϕ- | බල | -ව | -ද්දි | *(බලවද්දි)* |

## විශේෂණ ප්‍රකෘති සමඟ යෙදෙන සර්ග

විශේෂණ වචනවල නාම ක්‍රියා ආදි වචනවල මෙන් වචන ශ්‍රේණියක් දක්නට නොලැබෙන බැවින් ඒවා හඳුනාගන්නේ එහි ආචරණය (behaviour) අනුව යි. එම වචන සිංහලයේ යෙදෙන රටාව තිස්ස ජයවර්ධන (1996:15) මෙසේ දක්වයි.

(a) නාම ________ යි/ය

(b) ________නාම____

ඒ අනුව අහංකාර යන වචනය එම රටාවෙහි යෙදෙන්නේ මෙසේ ය.

(a) ළමයා අහංකාර යි

(b) අහංකාර ළමයා ____

ඒ අනුව ඔහු (1996:15) විශේෂණ නිර්වචනය කරන්නේ "(a) සහ (b) යන රටා තුළම යෙදෙන, වචන ශ්‍රේණියක් නොමැති, ඒ නිසා ම ප්‍රකෘති ප්‍රත්‍ය වශයෙන් විශ්ලේෂණය කළ නොහැකි වචන විශේෂණ නම් වේ" යනුවෙනි.

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95*
*ISSN 1800-1459*

මෙම විශේෂණ වචනයක් ප්‍රකෘති ප්‍රත්‍ය වශයෙන් විශ්ලේෂණය කළ නොහැකි බැවින් විශේෂණය යන ඒකකය ම එහි ප්‍රකෘතිය වේ. නිදසුන් ලෙස *අහංකාර* යන වචනය විශේෂණ වචනයක් වන අතර එය ම එහි ප්‍රකෘතිය වේ.

මෙම විශේෂණ ප්‍රකෘතිවලට ඇතැම් අවස්ථාවල විවිධ සර්ග එක් විය හැකි අතර එමඟින් එය විවිධ වෙනස්කම්වලට ලක් වේ. මෙසේ එක් වන සර්ග සියල්ලක් ම ව්‍යුත්පන්න සර්ග වන අතර එමඟින් ප්‍රකෘතියේ අර්ථය හෝ වචන වර්ගය හෝ වෙනස් කරයි.

විශේෂණ ප්‍රකෘති සමඟ ද පූර්වසර්ග මෙන් ම අපරසර්ග යෙදිය හැකි ය. මෙම යෙදෙන අපරසර්ග සියල්ලක් ම ව්‍යුත්පන්න සර්ග වේ.

| ව්‍යුත්පන්න පූර්වසර්ග | + | විශේෂණ ප්‍රකෘතිය | + | ව්‍යුත්පන්න අපරසර්ග |
|---|---|---|---|---|

විශේෂණ ප්‍රකෘති සමඟ යෙදෙන පූර්වසර්ගවල කාර්යය වන්නේ හුදෙක් ප්‍රකෘතියෙහි අර්ථය වෙනස් කිරීම යි. ඒවා වචන වර්ගය වෙනස් නොකරන බැවින් පූර්වසර්ගයක් එක් වූ විශේෂණ ප්‍රකෘතිය තව දුරටත් විශේෂණ වචනයක් ලෙස ම ක්‍රියා කරයි. නිදසුන් ලෙස /a-/ උපසර්ගය එක් වූ *මිහිරි* යන ප්‍රකෘතිය විශේෂණ වචන පිළිබඳ රටාවෙහි යෙදෙන අයුරු දැක්විය හැකි ය.

(a) ගීතය අමිහිරි යි/ය

(b) අමිහිරි ගීතය _____

| | | | | | |
|---|---|---|---|---|---|
| නිදː | ki:kəru | *(කීකරු)* | ⟶ | a-ki:kəru | *(අකීකරු)* |
| | priyə | *(ප්‍රිය)* | ⟶ | a-priyə | *(අප්‍රිය)* |
| | avaʃyə | *(අවශ්‍ය)* | ⟶ | an-avaʃyə | *(අනවශ්‍ය)* |
| | ahaŋka:rə | *(අහංකාර)* | ⟶ | nir-ahaŋka:rə | *(නිරහංකාර)* |

විශේෂණ ප්‍රකෘති සමඟ යෙදෙන ව්‍යුත්පන්න අපර සර්ගවල කාර්යභාරය වන්නේ නව වචන (Lexeme) නිර්මාණය හෝ වචන වර්ගය (Word Class) වෙනස් කිරීම යි. ඒ අනුව ඇතැම් ව්‍යුත්පන්න සර්ග මඟින් ක්‍රියා විශේෂණ නිර්මාණය සිදු වේ. ඒවා ක්‍රියා විශේෂණ සාධන විශේෂණ ව්‍යුත්පන්න ප්‍රත්‍ය ලෙස නම් කළ හැකි ය.

| | | | |
|---|---|---|---|
| නිදː | නා.වි. | *හොඳ* | *(හොඳ ළමයා)* |
| | ක්‍රි.වි. | *හොඳ-ට* | *(හොඳට බලන්න)* |
| | නා.වි. | *කීකරු* | *(කීකරු ශිෂ්‍යයා)* |
| | ක්‍රි.වි. | *කීකරු-ව* | *(කීකරුව ඉන්න ඕනැ)* |

ඇතැම් ව්‍යුත්පන්න සර්ග විශේෂණ ප්‍රකෘතිවලින් නාම ප්‍රකෘති නිර්මාණය කරයි. එම ප්‍රත්‍ය නාම සාධන විශේෂණ ව්‍යුත්පන්න ප්‍රත්‍යය ලෙස හැඳින්විය හැකි ය.

නිදː 1) අවශ්‍ය-තා

මෙසේ නිර්මාණය වන *අවශ්‍යතා* යන ප්‍රකෘතිය නාම ප්‍රකෘතියක් වශයෙන් භාෂාවෙහි ව්‍යක්ත වේ.

අවශ්‍ය-තා-අ (ඉ)

අවශ්‍ය-තා-ϕ-අට

අවශ්‍ය-තා-ϕ-එන්

අවශ්‍ය-තා-ϕ-ඒ

අවශ්‍ය-තා-ϕ-අක්

අවශ්‍ය-තා-ϕ

අවශ්‍ය-තා-වල්-අට

අවශ්‍ය-තා-වල්-ඉන්

අවශ්‍ය-තා-වල්-අ (ඉ)

2) අමාරු-කම්

අමාරු-කම්-අ (ඉ)

අමාරු-කම්-ϕ-අට

අමාරු-කම්-ϕ-එන්

අමාරු-කම්-ϕ-ඒ

අමාරු-කම්-අක්

අමාරු-කම්-ϕ

අමාරු-කම්-වල්-අට

අමාරු-කම්-වල්-ඉන්

අමාරු-කම්-වල්-අ (ඉ)

## නිගමනය

මේ අනුව පැහැදිලි වන්නේ සිංහල භාෂාවේ යෙදෙන්නේ පූර්වසර්ග හා අපරසර්ග පමණක් වන අතර මධ්‍යසර්ග කිසි සේත් නොයෙදෙන බව යි. කාර්යමය වශයෙන් සිංහල භාෂාවේ යෙදෙන මූලික සර්ග වන්නේ විභජන සර්ග සහ ව්‍යුත්පන්න සර්ගයි. සිංහල භාෂාවේ ව්‍යුත්පන්න සර්ග ලෙස

I පූර්වසර්ග හෙවත් උපසර්ග

II තද්ධිත ප්‍රත්‍ය

III කෘදන්ත ප්‍රත්‍ය

IV විශේෂණ ව්‍යුත්පන්න ප්‍රත්‍ය

යන සර්ග වර්ග යෙදෙන අතර විභජන සර්ග වශයෙන්

I ලිංග-වචන ප්‍රත්‍ය

II විභක්ති ප්‍රත්‍ය

III ක්‍රියා ප්‍රත්‍ය

යන සර්ග වර්ග යෙදේ.

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 80-95*
*ISSN 1800-1459*

## පරිශීලිත මූලාශ්‍රය

ජයවර්ධන, තිස්ස (1995) ''ප්‍රථමා විභක්තිය'', දැලබණ්ඩාර, ගාමිණී, රාජපක්ෂ, ආර්. එම්. ඩබ්ලිව් (සංස්) ***සම්භාව්‍ය ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය 2***, කැලණිය: සම්භාව්‍ය ප්‍රකාශන

ද සිල්වා, සුගතපාල (1963) ***විග්‍රහාත්මක වාග් විද්‍යාව***, කොළඹ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

Crystal, David (1995) *The Cambridge Encyclopedia of English Language*, Cambridge, University of Cambridge

Finch, Geofry (2005) *Key Concepts in Language and Linguistics*, New York, Palagrave Macmillan

Gleason, H. A. (1969) *An Introduction to Descriptive Linguistics*, (Rev.ed.), London, Holt Rinehart & Winston

Radford, Andrew et at, (1999) *Linguistics An Introduction*, Cambridge, Cambridge University Press

Wardhaugh, Ronald (1972) *Introduction to Linguistics*, New York, Mcgraw-Hill book company